35 වන පිටෙන්




කලේය.

දෙමළ දේශපාලන නායකත්වයන් විසින් යෝජනා කරන ලද වෙනම රටක් සඳහා වන අරගල ක්‍රමවේදය එහි අඩංගු වූ සියලුම විවේචනයන්ද සමඟ දෙමළ ජනතාව පිළිගත යුතු විය. ආයුධ සන්නද්ධ අරගලය හේතුවෙන් ඇතිවූ බාහිර පරිසරයෙහි වෙනස්වීම් ආයුධ දැරූ කාන්තාවන්ද අනුමත කරන බවට මතයක් සමාජයෙහි ඇති කර තිබුණි. කාන්තාවන් අරගලයට එක්වූ ආරම්භක කාලයේදී කාන්තාවන්ට එරෙහිව සමාජයේ හිස ඔසවා තිබූ දෝෂාරෝපණ ක්‍රමයෙන් අඩුවී ගොස් පසුව නැත්තටම නැති වූයේ ඒ නිසාය.
තවත් එක් වැදගත් කරුණක් වන්නේ දෙමළ සමාජයට අනුව අධික ලෙසින් මර්දනකාරී සංකල්ප සහ මතවාදයන් තුළින් පෝෂිත වන ලෙසින් කාන්තා පෞරුෂත්ව ශක්තිය පවුල් ව්‍යුහය තුළත් තීරණාත්මකව ගොඩනඟා පැවතීමයි. නිවෙසින් බැහැරට නොගිය, අධ්‍යාපනයක් නොලද ස්ත්‍රීන් ලෙස සිටියත් ඔවුන්ට බලය හා ඉතිරි කිරීම මගින් හදිසි අවස්ථාවලදී පවුලේ ආර්ථිකය දරා ගැනීමේ ශක්තිය සහිතව කාන්තාව බලවත් කර තිබුණි.
සාමාන්‍ය මිනිසෙකුට හිමි අයිතිවාසිකම් පවා ප්‍රතික්ශේප කෙරෙන අවස්ථාවන්හි දි ඉතාමත් ඉහළ ඉවසා දරාගැනීමේ ශක්තියෙන් යුතුව

**මෙහි පවතින අම්හිරි සත්‍යය නම් කාන්තාවන්ගේ දැනුම් සහ චින්තන වෙනස්වීම් ඇති කරනු වෙනුවට ආයුධ දරා සටන් කිරීම මගින් සමාජයෙහි තමන්ගේ තත්ත්වය ශක්තිමත් කරගැනීම වඩාත් පහසුවෙන් සිදුකළ හැකිය යනුවෙන් කාන්තාවන් ද සිතා සිටීමයි.**



ප්‍රශ්නවලට මුහුණ දීමේ ශක්තිමත් ආකල්පය කාන්තාව තුළ වර්ධනය වීමට හේතු වූයේ ඔවුන් මත වූ මර්දනයන්මය. මෙහිම දිගුවක් ලෙසින් ජාතියේ විමුක්තිය උදෙසා අයුධ සන්නද්ධ සටන්කාමී කාන්තාවන් ලෙස ඔවුහු අරගලයෙහි ආරම්භයෙහි දී එඩිතරව වීදියට බැස්සාහ.

ගැඹුරු දේශපාලන සහ සමාජ දැනුම ගවේෂණයක් සහිත වූ බොහෝ කාන්තාවෝ තබා ගොස් ඇති පා ලකුණු දිගේ දෙමළ කාන්තාවෝ අරගල කර දේශපාලනයට ප්‍රවේශ වූහ. මෙහි පවතින අම්හිරි සත්‍යය නම් කාන්තාවන්ගේ දැනුම් සහ චින්තන වෙනස්වීම් ඇති කරනු වෙනුවට ආයුධ දරා සටන් කිරීම මගින් සමාජයෙහි තමන්ගේ තත්ත්වය ශක්තිමත් කරගැනීම වඩාත් පහසුවෙන් සිදුකළ හැකිය යනුවෙන් කාන්තාවන් ද සිතා සිටීමයි.

මගේ පාසල් කාලයේදී විමුක්ති කොටි සංවිධානය එකම එක විශාල විමුක්ති සංවිධානය ලෙසින් මහත් වර්ධනයක් ලබා තිබුණි. කාන්තා බළසේනාවන් සටන් පෙරමුණුවල වීර ධීර ක්‍රියා මෙන් ජීවිත පරිත්‍යාගයන්හිදී ද යෙදී සිටියෝය. මම සංවිධානයට බැඳෙද්දි පාසල් වියේ උද්වේගය සහ උනන්දුව හැරෙන්නට දේශපාලන සමාජය පිළිබඳ කිසිම අවබෝධයක් මට තිබුණේ නැත.

1989 වසරේ සිට 1992 වසර දක්වා වූ කාලය තුළ දී කාන්තා සාමාජිකාවෝ දහස් ගණනින් සංවිධානයට එක්වූහ. එහෙයින් කාන්තා පුහුණුකාරියන් තුන්සිය දෙනා බැගින් සිටින මූලික ආයුධ පුහුණු කඳවුරු දෙකක් එකවර පැවැත්විය. යාපනයේ පොලිකණ්ඩිහි සුගී පුහුණු කඳවුර, තෙන්මාරාච්චි හි කිලාලි සෝදියා පුහුණු කඳවුර, තිලකා පුහුණු කඳවුර යනාදියට අමතරව 1992 වසරේදී දිවි බළසේනාව සහ මුහුදු කොටි කාන්තා කණ්ඩායම යනුවෙන් වර්ධනය වූ කාන්තා සාමාජික බළසේනාවන් ලෝකයේ වෙනත් කිසිම රටක නොමැති අයුරින් කොටි සංවිධානය තුළ ස්ථාපිත විය.

ආයුධ පුහුණුව ලැබූ කාන්තාවන්ට තම ශාරීරික ශක්තිය එතුළින් සහතික කළ හැකි වුවත් ඔවුන්ගේ මූලික සිතුම් පැතුම් කොයිතරම් දුරට වෙනස් වූයේද යන්න ප්‍රශ්නාර්ථයකි. පවුල් සංස්ථාවේ සිට එළියට පැමිණ සංවිධානය නම් සංස්ථාවට ඇතුළු වූ කොටි කාන්තාවන් සියලු දෙනාම විප්ලවවාදී නව චින්තනමය වෙනසකට ලක්වූ බව කිව නොහැකිය. වැඩ කටයුතුවල නිරත කාන්තාව නිවසේදී යම් පාලනයකට යටත්ව කාන්තාව හදා වඩා ගත්තේද එසේම, දුෂ්කර හමුදා පුහුණු පාලනයක් යටතේ කාන්තා බලසේනා සටන්කාමී කාන්තාවක් ලෙස සංවිධානය තුළ ඇයව පාලනයකට යටත්ව ඇති දැඩි විය.

**මතු සම්බන්ධයි**

JAPANESE
By a qualified experienced teacher with proven results
PREP to VCE
- Rapid Learning Strategies
- Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
- Exam Revision and Preparation for VCE written and oral exam.
12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University), B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.
Contact Number: 0425 396 975

NAATI Translator
Sinhalese/English
සිංහල ඉංග්‍රීසි පරිවර්තන
(Certificates/Documents for Visa matters)
Nadie Kammallaweera
Tel: 0481 179 189
Email: nadiekammallaweera@gmail.com

විදුලි වේගයෙන්...
YES Electrical Pty Ltd
New Installation
Electrical Repairs
Switchboard upgrades
LED Down lights
Celiing fans
Phone & Data Points
camera systems
Alarm Systems
TV Brackets & Antenna Installations
Maheel
Registered Electrical Contractor
Reg No 21920
M - 0430 293 260
Not available in December 2017 and January 2018